# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 1979/19 - 2016 අගෝස්තු මස 08 වැනි සඳුදා - 2016.08.08**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1980 අංක 02 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

1980 අංක 02 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනතේ, 2 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන වන මම, මහා නගර සහ බස්නාහිර සංවර්ධන විෂයභාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත මෙහි පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම, බස්නාහිර පළාත් මහා නගර සැලසුම් ව්‍යාපෘතිය යටතේ හොරණ ආයෝජන කලාපය ඇතුළු නාගරික සංවර්ධන කටයුතු සඳහා වහා අවශ්‍යව ඇති බව මාගේ මතය වන හෙයින්, එකී ඉඩම අදාළ කාර්යය සඳහා අවශ්‍ය බව මෙම නියමයෙන් ප්‍රකාශයට පත් කරමි.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2016 ජූලි මස 30 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කෝරළඉම සහ ඔළබොඩුව උතුර ග්‍රාම නිලධාරී කොට්ඨාශයන්හි හෙක්ටයාර් 43ක් (අක්කර 106, රූඩ් 00, පර්. 34) පමණ වන ඔළබොඩුවවත්ත, නයාගොඩ වත්ත, මීනේහේන වත්ත නමැති නාගරික සංවර්ධන අධිකාරියේ ඉඩම් නිලධාරී ආර්. සී. ලියනආරච්චි මිය විසින් පිළියෙල කරන ලද අංක 0006/2016 සහ 2016.03.17 දිනැති දළ සැලැස්මෙහි කැබලි අක්ෂර A සහ B මගින් දැක්වෙන ඉඩමට අදළ මායිම් පහත පරිදි වේ.

උතුරට : සමන් කුමාර සහ අනෙකුත් අය හිමිකම් පවසන කෝරළඉම සොයිසා මාවතේ අංක 213/2, 213/4 දරන ස්ථාන, විවෘත මුඩුබිම, නයාගොඩ පාර, ඔලබොඩුකන්ද පාර සහ කුඹුරු ඉඩම්,

නැගෙනහිරට : ඔළබොඩුකන්ද පාර, ඒ. වික්‍රමසිංහ සහ අනෙකුත් අය හිමිකම් පවසන රෝස්ගාර්ඩ්න් පාරෙහි අංක 260/41/S3, 260/41/A දරන ස්ථාන, ප්‍රජා ශාලාව, අත්හරින ලද කුඹුරු ඉඩම් සහ විවෘත මුඩුබිම, කේ. පී. ජයකොඩි හිමිකම් පවසන අංක 211/1 දරන ස්ථානය, අයිතිකරු සහ අංකය නොදන්නා නිවස සහ කුඹුරු ඉඩම්.



මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

උපලේඛනය (සම්බන්ධිතයි)

දකුණට : ප්‍රජා ශාලාව, කේ. පී. ජයකොඩි හිමිකම් පවසන අංක 211/1 දරන ස්ථානය, කුඹුරු ඉඩම් සහ විවෘත මුඩුබිම, ජේ. ඇනිනෝනා, එම්. චමින්ද සහ අනෙකුත් අය හිමිකම් පවසන නයාගොඩ වත්ත පාරේ අංක 91/B/10, 91/B/09, 91/B/05, 91/B/04 දරන ස්ථාන සහ හොරණ කොළඹ ප්‍රධාන මාර්ගය.

බටහිරට : නයාගොඩ පාර, කුඹුරු ඉඩම්, අත්හරින ලද කුඹුරු ඉඩම් සහ විවෘත මුඩුබිම, ඩී. කේ. ආරියවංශ සහ අනෙකුත් අය හිමිකම් පවසන නාගහගොඩ වත්ත පාරේ අංක 91/B/10, 91/B/09, 91/B/05, 91/B/04 දරන ස්ථාන සහ අයිතිකරුවන් නොදන්නා හිස් ඉඩම්, අයිතිකරු සහ අංකය නොදන්නා නිවස සහ හොරණ කොළඹ ප්‍රධාන මාර්ගය.

08-641

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.